00028

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 04 වන මට්ටම
අවසාන පරීක්ෂණය - පළමු අර්ධ වර්ෂය 2023/2024
**DSD 4502/SSD2202** - ව්‍යාපෘති සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම

කාලය: පැය දෙකයි (02)

---

දිනය : **25.11.2023** වේලාව : ප.ව **1.30** – ප.ව **3.30**

---

උපදෙස් :

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 කි.
- පැහැදිලි අත් අකුරු අපේක්ෂා කෙරේ.

1.

I. ක්‍රියාකාරකම් සහ සම්පත් සම්බන්ධව ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ වාසි විස්තර කරන්න. *(ලකුණු 10)*

II. ව්‍යාපෘති සැලසුම් කිරීමේදී තත්ත්ව විශ්ලේෂණයේ සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයේ මූලධර්ම පැහැදිලි කරන්න. *(ලකුණු 15)*

2.

I. පාර්ශවකරුවන්ගේ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට භාවිතා කරන මෙවලම් විස්තර කරන්න. *(ලකුණු 10)*

II. පාර්ශවකරුවන්ගේ විමර්ශන ක්‍රමයක් ලෙස සහභාගීත්ව ග්‍රාමීය ඇගයීමේ (Participatory Rural Appraisal/ PRA) වාසි සහ අවාසි සාකච්ඡා කරන්න. *(ලකුණු 15)*

3.

I. ඔබට ගමක තරුණ ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට අවශ්‍ය යැයි සිතන්න. ව්‍යාපෘතියේ අරමුණු සහ අපේක්ෂිත ප්‍රතිඵල හඳුන්වා දෙන්න. *(ලකුණු 05)*

II. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රමෝපායක් සැලසුම් කරන්න. *(ලකුණු 10)*

III. මෙම ව්‍යාපෘතිය සඳහා ලඝු රාමු න්‍යාසයක් (Log Frame Matrix/LFM) සංවර්ධනය කරන්න. *(ලකුණු 10)*

4.

I. ව්‍යාපෘති ලේඛනයක තිබිය යුතු අත්‍යවශ්‍ය අංග කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 08)*

II. 'ඔබ සංවිධානයට අරමුදල් ලැබීම තීරණය කරන තීරණාත්මක සාධකය වන්නේ හොඳ අයවැයක් තිබීමයි'. අයවැයක් තුළ පැවතිය යුතු මූලික අංග පැහැදිලි කරන්න. *(ලකුණු 10)*

III. අයවැය ඉදිරිපත් කිරීම පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. *(ලකුණු 07)*

5.

I. ව්‍යාපෘති සැලසුම ක්‍රියාවට නැංවීමේ අවසන් අදියර වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමයි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඔබ මුහුණ දිය හැකි අභියෝග සාකච්ඡා කරන්න. *(ලකුණු 10)*

II. 'වගකිව යුතු බව (Accountability) යන්නෙන් අදහස් කරන්නේ ප්‍රශ්න වලට පිළිතුරු දියහැකි බවයි', කණ්ඩායම් සාමාජිකයින්ගේ හැසිරීම සහ ප්‍රතිචාර දැක්වීම මඟින් වග කිව යුතුබව මිනුම් කරන ප්‍රධාන මිනුම් පැහැදිලි කරන්න. *(ලකුණු 15)*

6.

I. ව්‍යාපෘතියක් අධීක්ෂණය කිරීමේදී සාධනයට ලක්විය යුතු මූලික කරුණු මොනවදැයි විස්තර කරන්න. *(ලකුණු 10)*

II. ව්‍යාපෘතියක් අධීක්ෂණය කිරීමේ විවිධ අවධීන් (පියවරයන්) පැහැදිලි කරන්න. *(ලකුණු 10)*

III. අධීක්ෂණ ක්‍රියාවලියේදී පසු විපරම් පද්ධතියක වැදගත්කම පැහැදිලි කරන්න. *(ලකුණු 05)*

7.

I. ව්‍යාපෘතියක් විශ්ලේෂණය කිරීමේ විවිධ අරමුණු සාකච්ඡා කරන්න. *(ලකුණු 10)*

II. උද්භව (formative) සහ ආකලනමය (summative) විශ්ලේෂණය අතර වෙනස සහ ඒවායේ ප්‍රයෝජන පැහැදිලි කරන්න. *(ලකුණු 15)*

8. පහත මාතෘකා වලින් ඕනෑම පහක් (05) ගැන කෙටි සටහන් ලියන්න. *(ලකුණු 05 බැගින්)*

I. සහභාගීත්ව ග්‍රාමීය ඇගයීම (PRA) හි මූලධර්ම
II. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායන්
III. තාර්කික සැකිලි පිවිසුම (LFA)
IV. ක්‍රියාවලිය එදිරිව ප්‍රතිඵල දර්ශක
V. ව්‍යාපෘති පාර්ශවකරුවන්
VI. ව්‍යාපෘති සම්බන්ධීකරණයේ වැදගත්කම
VII. ව්‍යාපෘති විශ්ලේෂණ ක්‍රියාවලිය

**********සියළුම හිමිකම් ඇවිරිණි**********